# ඔමික්‍රෝන් පරදන නව විකෘතියක් ප්‍රංශයෙන්

**පැරිසියේදීය (රොයිටර්)**

'ඔමික්‍රෝන්' විකෘතිය පරදන නව 'කොවිඩ් 19' විකෘතියක් ප්‍රංශයෙන් හමුවී තිබේ. ප්‍රංශ සෞඛ්‍ය අංශ මෙම විකෘතිය නම් කර ඇත්තේ 'අයි.එච්.යූ-බී.1.640.2' යන නමිනි.

නව විකෘතිය සහ ඒ සම්බන්ධ පර්යේෂණ අධ්‍යයන වාර්තා 'මෙඩ්රිව්' නමැති ප්‍රංශ වෛද්‍ය විද්‍යා සඟරාවේ ද පළ වී ඇත. එම පර්යේෂණ වාර්තා අනුව, නව විකෘතිය නිර්මාණය වී ඇත්තේ තවත් විකෘති 46 එකිනෙක මුසුවීමෙනි. ඒ අනුව, මෙම නව විකෘතිය, 'කොවිඩ් 19 ඔමික්‍රෝන්' විකෘතිය ද අභිබවා යයි.

මේ වනවිට ප්‍රංශයේ 'ඔමික්‍රෝන්' විකෘතිය දරුණු ලෙස ව්‍යාප්ත වෙයි. මෙම නව විකෘතිය, ප්‍රංශයෙන් හමුවී ඇත්තේ එරට 'ඩෙල්ටා' විකෘතිය අභිබවා, 'ඔමික්‍රෝන්' ප්‍රධාන විකෘතිය බවට පත් වී ඇති අවස්ථාවකය.

කෙසේ නමුත්, 'අයි.එච්.යූ බී.1.640.2' විකෘතියේ ආරම්භය සිදුවී ඇත්තේ ප්‍රංශයෙන් ද නැතිනම් මධ්‍යධරණී රටකින් ද යන්න සම්බන්ධයෙන් සැකයක් පවතී. ප්‍රංශ සෞඛ්‍ය බලධාරීන්ට, පළමුවෙන් හමුවුණු බී.1.640.2 ආසාදිතයා කැමරූන් රාජ්‍යයේ සිට පැමිණි අයකු බව පැවැසෙයි.

මේ වනවිට ප්‍රංශයේ මාර්සේල් නුවරින් 'අයි.එච්.යූ බී.1.640.2' ආසාදිතයන් 12 දෙනකු හමුවී ඇති බව ද සෞඛ්‍ය අංශ නිකුත් කළ නිවේදනයක දැක්වෙයි. 'අයි.එච්.යූ බී.1.640.2' විකෘතිය සම්බන්ධයෙන් නිල දත්ත ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත යොමු කළ බව ද ප්‍රංශ සෞඛ්‍ය අංශ කියයි.

'අයි.එච්.යූ බී.1.640.2' ග්‍රීක හෝඩියේ අක්ෂරයකින් නම් කිරීම ඉදිරියේ දී සිදුවනු ඇත. එය සිදුවන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානය නව විකෘතිය විශ්ලේෂණය කර එය බිහිසුණු ද නැද්ද යන්න වර්ග කිරීමෙන් පසුවය.